GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

10-10-2012

**මාධ්‍ය නිවේදනයයි.**

පසුගිය වසර කිහිපය තුල විද්වතුන්ට පහර දීමේ ප්‍රවණතාවයක් වර්ධනය වෙමින් පවතියි. වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරිවරයාට පහර දීම, වෛද්‍ය සභාවේ විධායක සභික වෛද්‍ය ලලන්ත රණසිංහ මහතාගේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාට පහර දීම යන සිද්ධි දාමයෙන් මෙය මනාව පැහැදිලි වේ. ඉහත සිද්ධීන් වලට අදාලව, කිසිඳු සැකකරුවෙකු මේ වන තුරු අත් අඩංගුවට ගැනීමට පොලිසිය අපොහොසත් වී ඇත. මෙවන් පසුබිමක ආසන්නතම සිද්ධිය වාර්තා වන්නේ 2012.10.09 වන දින විශේෂඥ වෛද්‍ය ලලන්ත රණසිංහ මහතාගේ රියදුරුට පහර දී වාහනය පැහැරගැනීමට දරණ ලද උත්සාහයයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විධායක සභිකයකු වන විශේෂඥ වෛද්‍ය ලලන්ත රණසිංහ මහතා මාලඹේ ව්‍යාජ වෛද්‍ය උපාධි ආයතනයට එරෙහිව වෛද්‍ය සභාව තුල ප්‍රබල හඬක් මතු කරන සහ පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය පිළිබඳ ඍජු මතවාදයක් පල කරන විද්වතෙකි.

පසුගිය අගෝස්තු මාසයේ ඒ මහතාගේ නිවසට බෝම්බ ප්‍රහාරයක් එල්ල වූ අතර, ඊට අදාල සැකකරුවන් අත් අඩංගුවට ගැනීමට මේ වන තුරු පොලිසිය අපොහොසත් වී ඇත.

මේ සිද්ධි දාමය පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දැඩි අප්‍රසාදය පලකරන අතර, වගකිව යුත්තන් වහාම අත් අඩංගුවට ගෙන නීතිය හමුවට ඉදිරිපත් කළ යුතු බව අවධාරණය කර සිටියි.

ස්තූතියි,

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර: | වෛද්‍ය නලින් ආරියරත්න | 0714800942 |
| | වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |